# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2312/15 - 2022 දෙසැම්බර් මස 28 වැනි බදාදා - 2022.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ වූ නියෝගය

නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවර අනුරාධා යහම්පත් වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල මත පහත සඳහන් නියෝගය මෙයින් දන්වා සිටිමි.

**අනුරාධා යහම්පත්,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
ඔර්ස්හිල්,
ත්‍රිකුණාමලය.

**නියෝගය**

නැගෙනහිර පළාතට අයත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කින්නියා ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් 2023 වර්ෂය සඳහා අයවැය ලේඛන ලියකියවිලි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 සහ 169 වගන්ති අනුව ඉදිරිපත් කරනු ලැබ, එය සම්මත නොකරනු ලැබූ හේතුවෙන් සහ 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වන වගන්තිය අනුව කටයුතු නොකිරීම හේතුවෙන්, 2022.12.16 වැනි දින සිට සභාපති ධුරය අතහැර ගියා සේ සලකා, එදින සිට බලපැවැත්වෙන පරිදි අදාළ සභාවේ සභාපති ධුරය පුරප්පාඩු පවතින බව සැලකේ.

1A - PG 6127 — 07 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

1987 වසරේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 171 (ආ) වගන්තිය යටතේ මා වෙත ලබාදී ඇති බලතල අනුව, නැගෙනහිර පළාතේ ආණ්ඩුකාර අනුරාධා යහම්පත් වන මම භාණ්ඩ, මූල්‍ය පරිපාලනය හා ඒ සම්බන්ධව අතර මැදි කරුණු පිළිබඳව මෙම පනත එහි සවිස්තර කාල පරාසය තෙක් පහත සඳහන් නීති ක්‍රියාත්මක කිරීමට මෙමගින් බලය පවරමි.

**අනුරාධා යහම්පත්,**
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
ඔර්ස්හිල්,
ත්‍රිකුණාමලය.

**නීතිය**

නැගෙනහිර පළාතට අයත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සීමාව තුළ පිහිටි කින්නියා ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ අයවැය වාර්තාව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 සහ 169 යන උපඡේදවල අවශ්‍යතාව අනුව සම්මත කිරීමට අපොහොසත් වීම හේතුවෙන් කින්නියා ප්‍රාදේශීය සභාවේ සභාපති තනතුර 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වැනි කොටසට අනුව පුරප්පාඩු වී ඇත. ඒ අනුව 2012 වසරේ අංක 22 වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතට අනුව මෙමගින් කින්නියා ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා වන අයවැය යෝජනා ලබාදීම සඳහා පුරප්පාඩු වී ඇති සභාපති තනතුර සඳහා පත් කිරීම් සිදුකල හැකිය. එම නිසා මම ත්‍රිකුණාමලය පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත 2022 ඉතිරි කාලය සඳහා ඇතිවෙන වියදම් සහ ඉහත සඳහන් අයවැය කෙටුම්පතට අනුව 2023 වර්ෂය සඳහා පහත සඳහන් යෝජනා වගුවේ සඳහන් කටයුතු 2022.12.16 වැනි දින සිට පුරප්පාඩුව ඇති කින්නියා ප්‍රාදේශීය සභාවේ සභාපති තනතුර සඳහා වන පත්කිරීම් සිදුකරන තෙක් සිදු කිරීමට බලය ලබාදෙමි.

**යෝජනා :**

01. වැටුප් හා ගෙවීම්
02. ගමන් වියදම්
03. ලිපි ද්‍රව්‍ය
04. පුනරාවර්තන වියදම්
05. එල්ඩීඑස්පී හා සීඩීඑල්ජී ව්‍යාපෘති සම්බන්ධ වියදම්
06 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදන ප්‍රදාන

EOG 12-0364

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.